සියලු ම හිමිකම් ඇවිරිණි All Rights Reserved

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය

2015 Revision

# ආර්ථික විද්‍යාව II
# ECONOMICS II

| ඇගයීම් අංක - **09** | විනාඩි 30 යි<br>30 Minutes |
|---|---|

01. **(i)** 1. දේශීය මූලාශ්‍ර (කුටුම්බ ඉතුරුම්, ව්‍යාපාර ඉතුරුම්, රාජ්‍ය ඉතුරුම්)
2. විදේශීය මූලාශ්‍ර (විදේශ ණය, විදේශ ප්‍රදාන හා ආධාර, විදේශ ආයෝජන) (ලකුණු 02 බැගින්)

**(ii)** මානව ප්‍රාග්ධනය යනු කිසියම් පුද්ගලයෙකු විසින් අධ්‍යාපනය, පුහුණුව හා අත්දැකීම් මගින් අත්කරගනු ලැබූ නිපුණතා, දැනුම, සමාජයීය හා පෞරුෂත්ව ගුණාංග සම්භාරයයි. (ලකුණු 01 යි)

මානව ප්‍රාග්ධනය, ප්‍රාග්ධනයක් වශයෙන් සැලකීමට හේතු :
1. මානව ප්‍රාග්ධනය ශ්‍රමයේ ඵලදායීතාව වර්ධනයට හේතු වීම
2. නිෂ්පාදන හෝ ආදායම් ප්‍රවාහයක් බිහි කිරීමට හා අනාගත පරිභෝජන මට්ටම වැඩිකර ගැනීමට හේතු වීම
3. මානව ප්‍රාග්ධනය ද මිනිසා තුළ සිදු කෙරෙන ආයෝජනයේ ප්‍රතිඵලයක් වීම.

(එක් කරුණකට ලකුණු 01 බැගින්)

**(iii)** නවෝත්පාදනයන් (නව්‍යතා) සම්පාදනය මගින් පාරිභෝගික අවශ්‍යතා ඉටු කෙරෙන හෝ නිෂ්පාදන පිරිවැය අඩු කෙරෙන හෝ අලුතින් යමක් බිහි කිරීම සිදුවේ.

උදා : - අලුත් භාණ්ඩයක් හෝ පවත්නා භාණ්ඩයක ගුණාත්මක වෙනසක් සිදු කිරීම.
- අලුත් නිෂ්පාදන ක්‍රමයක් හඳුන්වා දීම.
- අලුත් වෙළෙඳ පොළක් සොයා ගැනීම.
- අලුත් ව්‍යාපාර සංවිධාන ක්‍රමයක් හෝ ප්‍රතිසංවිධානයක් හඳුන්වා දීම.

නව්‍යතාවන් ව්‍යාපාරික පදනමකින් සාර්ථකව හඳුන්වාදීම ව්‍යවසායකත්වයේ ප්‍රධාන කාර්යයක් වේ.
(ලකුණු 02 යි)

නවෝත්පාදනය මගින් නව අදහස්, නව ක්‍රමයන් භාවිතය හෝ අලුත් වෙනස්කමක් හඳුන්වා දීම සිදුවේ. නව අදහස් හා ශිල්ප ක්‍ර මගින් ව්‍යාපාරවල නිෂ්පාදන පිරිවැය අඩුකරගත හැකි වනවා මෙන්ම හිඟ සම්පත් උපයෝජනයේ ශීඝ්‍රතාවය ද ඉහළ යයි. එමෙන්ම නව වෙළෙඳ පොළවල් සොයා ගැනීම මගින් ව්‍යාපාර ආයතනවල පරිමාණය විශාල වීමෙන් පරිමාණානුකූල පිරිමැසුම් අත්කරගත හැකිය. එමගින් ව්‍යාපාරවල අවදානම අඩු වේ. එමෙන්ම නව භාණ්ඩ හා සේවා හඳුන්වා දීම තුළින් නව ඉල්ලුමක් බිහිකරගත හැකිය. තරගකාරීව සාර්ථකව ව්‍යාපාර මෙහෙයවීමට හැකියාව ලැබේ. වේගයෙන් වෙනස්වන ලෝකයේ එම වෙනස්කම්වලට ප්‍රතික්‍රියා දැක්විය හැකි නව්‍යතා උත්පාදනය සිදුකළ යුතුය. එසේ නොවන ආර්ථිකයන් එකතැන පල්වන ආර්ථික බවට පත් වේ. (ලකුණු 02 යි)

(iv) අ.




(නිවැරදි නිෂ්පාදන හැකියා වක්‍රයට ලකුණු 02 යි)

ආ. පාරිභෝජන භාණ්ඩ ඒකක 20 ක් කැපකර ඇත.
ප්‍රාග්ධන භාණ්ඩ ඒකක 90 ක් කැපකර ඇත.

(ලකුණු 01 බැගින් ලකුණු 02 යි)

ඉ. 1. ආර්ථිකය සතු සම්පත් සම්භාරය ස්ථාවර බව
2. සම්පත් කාර්යක්ෂමව භාවිත කරන බව
3. තාක්ෂණය නොවෙනස්ව පවතින බව
4. භාණ්ඩ දෙකක් පමණක් නිෂ්පාදනය කරන බව

(ලකුණු 01 බැගින් ලකුණු 04 යි)

සැකසුම ඃ බණ්ඩාර දිසානායක
B.Sc.(Mgt)Sp